# ඇබෑර්තු

## 3268 - ශ්‍රී - ආසියානු සංවර්ධන බැංකුව (ADB) මගින් අරමුදල් සපයන මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

MWSIP හි වැඩසටහන් කළමනාකරණ ඒකකයේ (PMU) සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයන්හි පහත සඳහන් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සුදුසුකම් සපිරූ ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු සහ රැකියා පැතිකඩ | සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|
| **මිහිපේ වම් ඉවුර ඇලමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය (MLBCRP)**<br>**1.0 නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - තනතුරු 01 යි.**<br>**රැකියා පැතිකඩ**<br>ව්‍යාපෘතියේ සෑම කාර්යකදීම ව්‍යාපෘති අධ්‍යක්ෂ හට සහාය වීම. NWPCP යටතේ ඉදිකිරීම් වැඩසටහන් මුළුමනින්ම අධීක්ෂණය කිරීම. ව්‍යාපෘතිය යටතේ මැටි වේලි දෙකක් ඉදිකිරීමෙහිලා තාක්ෂණික උපදෙස් ලබාදීම. ඉදිකිරීම් වැඩසටහන පරිදි ප්‍රගතිය ලබාගැනීමෙහිලා ව්‍යාපෘති අධ්‍යක්ෂහට සහායවීම.<br>**2.0 ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු - තනතුරු 01 යි.**<br>**රැකියා පැතිකඩ**<br>වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධන වැඩ සහ වාරිමාර්ග යෝජනාක්‍රම පුනරුත්ථාපන කටයුතු ක්‍රියාත්මක කිරීම පිළිබඳ තාක්ෂණික උපදෙස් ලබා දීම. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් අදාල ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය හෝ අදාල ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් සුදුසුකමක් හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක වෘත්තීය සුදුසුකමක් සාර්ථකව නිමා කරලීම.<br>**සමග**<br>ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 04 ක් ඇතුළු කළමනාකරණ මට්ටමේ වසර 08 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද<br>**හෝ**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ප්‍රථම උපාධියක්<br>**සහ**<br>පශ්චාත් උපාධියක් හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය<br>**සමග**<br>කළමනාකරණ මට්ටමේ අඩුතරමින් වසර 06 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.<br>**හෝ**<br>රජයේ දීප ව්‍යාප්ත සේවයේ I වන පංතියේ නිලධාරියකු වීම හෝ අදාල ක්ෂේත්‍රයේ සමාන කාර්ය තත්ත්වයක්<br>**සමග**<br>I වන පංතියේ තනතුරක අඩුතමින් වසර 5 ක පළපුරුද්ද<br>වැටුප : රු. 125,000.00 – රු. : 140,000.00* |
| **3.0 වාරිමාර්ග / සිවිල් ඉංජිනේරු - තනතුරු 03 යි.**<br>**රැකියා පැතිකඩ**<br>නව වාරිමාර්ග ඉදිකිරීම් කර්මාන්ත සැළසුම් කිරීම, නිර්මාණය සහ ක්‍රියාත්මක කිරීමෙහිලා සහ වාරිමාර්ග යෝජනාක්‍රමවල වෙනත් යටිතල පහසුකම් පුනරුත්ථාපන කටයුතු ක්‍රියාත්මක කිරීමෙහි තාක්ෂණික උපදෙස් ලබාදීම | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් අදාල ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය හෝ අදාල ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසු කමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් සුදුසුකමක් හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක වෘත්තීය සුදුසුකමක් සාර්ථකව නිමා කරලීම.<br>**සහ**<br>අදාල ක්ෂේත්‍රයේ අඩුතරමින් වසර 06 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.<br>**හෝ**<br>රජයේ දීපව්‍යාපත්ත සේවයේ iii/ii වන පංතියේ හෝ ඉහළ පන්තියක නිලධාරියකු වීම හෝ අදාල ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයක්<br>**සමග**<br>ii/iii වන පංතියේ තනතුරක අඩුතරමින් වසර 5 ක පළපුරුද්ද වැටුප : රු. 100,000.00 – රු. 115,000.00* |
| **4.0 ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරි - තනතුරු 01 යි.**<br>**රැකියා පැතිකඩ**<br>MWSIP ව්‍යාපෘතිය යටතේ කරගෙන යනු ලබන සියලුම ඉංජිනේරු ඉදිකිරීම් අධීක්ෂණය හා තත්ව පාලනය පිළියෙල කිරීමෙහිලා ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී නිරතවිය යුතුය.<br>**5.0 ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරි - තනතුරු 01**<br>**රැකියා පැතිකඩ**<br>ජ්‍යෙෂ්ඨ තාක්ෂනික නිලධාරියා විසින් මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩ සටහන (MWSIP) යටතේ ඉටුකරනු ලබන. සියළුම ඉංජිනේරුමය ඉදිකිරීම් වල තත්ත්ව පාලනය හා අධීක්ෂණය පිළිබඳ කටයුතු සකස් කිරීමේ නියැලිය යුතු වන්නේය. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් අදාල ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය හෝ අදාල ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් සුදුසුකමක් හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක වෘත්තීය සුදුසුකමක් සාර්ථකව නිමා කරලීම.<br>**හෝ**<br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාල තනතුරක් සඳහා වන, ජාතික වෘත්තීය සුදුසුකම් 7 වන මට්ටමට අඩු නොවන ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම<br>**සහ**<br>අවශ්‍ය විශේෂතා සාමාර්ථයන් පිළිබඳ අඩුතරමින් වසර 03 ක පළපුරුද්ද<br>**හෝ**<br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාල තනතුරක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 6 වන මට්ටමට අඩු නොවන ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම<br>**සහ**<br>අවශ්‍ය විශේෂතා සාමාර්ථයන් පිළිබඳ අඩුතරමින් වසර 8 ක පළපුරුද්ද<br>**හෝ**<br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘතීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාල තනතුරක් සඳහා වන, ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට අඩු නොවන ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම<br>**සහ**<br>අවශ්‍ය විශේෂතා සාමාර්ථයන් පිළිබඳ අඩු තරමින් වසර 13 ක පළපුරුද්ද.<br>**ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරී තනතුර** සඳහා ආධාර නියෝජිතායතන වල පරිසර සුරැකීමේ ප්‍රතිපත්ති පිළිබඳ දැනුම ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ.<br>**ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී තනතුර** සඳහා ශ්‍රී ලංකාවේ භාවිත කරනු ලබන කොන්ත්‍රාත් කොන්දේසි අර්ථ නිරූපනය කිරීමේ හා වාරිමාර්ග සහ ජලාපවහන, මාර්ග සහ ගොඩනැගිලි අදාල මෘදුකාංග නිපුණතා පිළිබඳ හැකියාව සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ.<br>වැටුප : රු. 75,000.00 – රු. 81,000.00* |

*** ඉහත විස්තර කොට ඇති වැටුපට අමතරව MSD චක්‍රලේඛය ප්‍රකාරව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.**

**පොදු කොන්දේසි :**

01. අයදුම්කරුවන් වයස අවුරුදු 65 ට අඩු අය විය යුතුය.
02. සියලුම නිලධාරීන්, අදාල රජයේ සංවිධාන හා අනෙකුත් නියෝජිතායතන සමග සහයෝගයෙන් හා සම්බන්ධීකරණයෙන් තම රාජකාරි ඉටු කරනු ඇතැයි බලාපොරොත්තුවේ
03. ශ්‍රී ලංකාව තුළ විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති පිළිබඳ වැඩ පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.
04. ඉංග්‍රීසි භාෂාවේ නිපුණත්වය, රජයේ රෙගුලාසි පිළිබඳ මනා දැනුම සහ පරිගණක සාක්ෂරතාව මෙම තනතුරු සඳහා පූර්ව අවශ්‍යතාවයන් වේ.
05. රැකියා කොන්ත්‍රාත්, කාර්යසාධනය සහ ව්‍යාපෘති / වැඩසටහන් වල අවශ්‍යතාව මත පදනම්ව වාර්ෂිකව අලුත් කළ හැකි පරිදි වසර 3 ක් සඳහා වේ.
06. රජයේ අනුමත වැටුප් පරිමාණයන් අංක 2016/01 දරන කළමනාකරණ සේවා චක්‍ර ලේඛය හා ඉන් අනතුරුව වූ ප්‍රතිශෝධන පරිදි දීමනාවන් සමග පිහිටුවනු ඇත.

**අයදුම්පත් :**

අයදුම්කරුවන් තම අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සඳහන් ජීව - දත්ත ඇතුළත් අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග ලියාපදිංචි තැපෑලෙන් **2018 අප්‍රේල් 05** වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන්ට සැලසිය යුතුය. අයදුම්කරන තනතුර කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**වැඩසටහන් අධ්‍යක්ෂ ( MWSIP)**
**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන,**
**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,**
**නො. 493 - 1/1, ටී.බී. ජයා මාවත,**
**කොළඹ - 10.**

ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තු ගත කරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, තෝරාගැනීම කුසලතා මත පදනම්ව සිදු කෙරේ. **බඳවා ගැනීම සඳහා කෙරෙන ඕනෑම බලපෑමක් හෝ නියෝජනයක් අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත.** මූලික සුදුසුකම් සනාථ කරලීමට සහතික පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතු අතර, අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

රාජ්‍ය / අර්ධ රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් තම අයදුම්පත් ඔවුන්ගේ අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

**ලේකම්,**
**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,**
**නො. 500, ටී.බී. ජයා මාවත,**
**කොළඹ - 10.**